**අපස්මාර රෝහල සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---

අපස්මාර රෝහල සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල (එස්එෆ්ඩී) අතර 2008 මාර්තු 26 දින එළඹි අංක 7/477 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 11/640 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, කොළඹ මහ රෝහල පරිශ්‍රයේ සම්පූර්ණ උපකරණවලින් සමන්විත අපස්මාර රෝහලක් ඉදිකිරීම හා එක් එක් පළාත්වල, පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,918 ක් වන අතර ඉන් සවුදි රියාල් මිලියන 75 කට සමාන රු.මිලියන 2,273 ක මුදලක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල එකඟවී තිබුණි. තවද 2015 ඔක්තෝබර් 30 දින අතිරේක ණය ගිවිසුමක් මඟින් සවුදි රියාල් මිලියන 45 කට සමාන රු.මිලියන 1,690.65 ක අතිරේක ණය මුදලක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 26 දින ආරම්භ කරන ලද අතර 2010 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2016 ජුනි 30 දක්වා අවස්ථා 4 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යා යැයි සලකනු ලැබු එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යාන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් හා කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වලට අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | සවුදි රියාල් මිලියන | රු.මිලියන | රු. මිලියන | සවුදි රියාල් මිලියන | රු.මිලියන | සවුදි රියාල් මිලියන | රු.මිලියන |
| එස්එෆ්ඩී | 120 | 3,963.65 | 1,802 | 15.73 | 545.29 | 63.99 | 2,218.06 |
| ශ්‍රීලංර | - | 645.00 | 288 | - | 146.90 | - | 489.30 |
| | 120 | 4,608.65 | 2,090 | 15.73 | 692.19 | 63.99 | 2,707.36 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු ලක්ෂණයක් ලෙස, වාර්ෂිකව අයවැය ඇස්තමේන්තුව මඟින් කරන ලද වෙන් කිරීම් උපයෝජනය කිරීම සඳහා ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. පෙර වර්ෂවල අයවැය ඇස්තමේන්තු මඟින් එකතුව රු.බිලියන 4.62 ක වෙන්කිරීම් කර තිබුණද, ඉදිකිරීම් වැඩවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දක්වා රු.බිලියන 2.71 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ණය ආපසු ගෙවීම සඳහා වූ වර්ෂ 05 ක අනුග්‍රහ කාලය 2013 මාර්තු 26 දිනට අවසන් වී හා 2015 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.මිලියන 329.74 ක ණය වාරික හා එකතුව රු.මිලියන 71.76 ක පොලී ඒ සඳහා ගෙවා තිබුණද, ව්‍යාපෘතිය විසින් කාර්යයන් නිම කිරීම මඟින් හා අරමුණු කළ කාර්යයන් සඳහා ණය මුදල් ඵලදායීව උපයෝජනය කිරීම මඟින් ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීම සඳහා සවුදි රියාල් මිලියන 45 කට සමාන රු.මිලියන 1,690.65 ක අතිරේක මූල්‍යයන පහසුකමක් සඳහා ව්‍යාපෘතිය විසින් ඉල්ලීමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 969.80 ක වෙන් කිරීමක් පමණක් කර තිබුණද, ඒ සඳහා කොන්ත්‍රාත්තුව රු.මිලියන 1,884.82 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි.

(ii) අපස්මාර රෝහල හා පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීමට ණය ගිවිසුමේ සලසන ලද රු.මිලියන 1,075.90 ක් වූ වෙන් කිරීමෙන්, ව්‍යාපෘතියේ අරමුණු වලට අදාළ නොවන ජාතික රෝහලේ ස්නායු ක්ෂිති ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 337.26 ක මුදලක් උපයෝජනය කර තිබුණි. උපකරණ ප්‍රසම්පාදනය සඳහා වෙන්කරන ලද ඉතිරි මුදල් ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් වැඩ පිළිබඳ ගෙවීම් සඳහා උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද ණය සපයන ලද නියෝජිතායතනයෙන් ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉහත වැඩ පිළිවෙලෙහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය උපකරණ, ලී බඩු , ජෙනරේටර්, උපදේශක සේවා ප්‍රසම්පාදනය කිරීම හා අතිරේක පිරිවැය දැරීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,480 ක් වූ අතිරේක අරමුදල් අවශ්‍යතාවය ඉල්ලුම් කර තිබුණි.

(iii) උපදේශක සේවා සඳහා ණය ගිවිසුමේ රු.මිලියන 106.10 ක් වූ වෙන් කිරීමක් කර තිබුණද, ඒ සඳහා කොන්ත්‍රාත්තුව රු.මිලියන 164.05 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද රු.මිලියන 244.01 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට උපදේශකවරයාට ගෙවා තිබුණි.

(ඇ) ලැබුණු තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ගෙවිය යුතු ප්‍රතිපූර්ණය කළ යුතු විදේශ ආධාර රු.මිලියන 640.28 ක් වූ අතර ඉන් රු.මිලියන 133.94 ක මුදලක් වර්ෂ 1 කට වැඩි කාලයක් ගෙවිය යුතු ලෙස පැවතුණි.

**3.2 භෞතික කාර්ය සාධනය**

**-------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, 2014 අප්‍රේල් 03 වන විට නිම කිරීමට සැලසුම් කරන ලද අපස්මාර රෝහල සඳහා මහල් 08 ක ගොඩනැඟිලිවල ඉදිකිරීම් වැඩ නිම කිරීම සඳහා දින 637 ක ප්‍රමාදයක් සහිතව 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 90 ක මට්ටමේ පැවතුණි. කෙසේ වුවද මහජනතාවගේ භාවිතය සඳහා රෝහල විවෘත කිරීමට 2016 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරුගෙන් ගොඩනැඟිල්ල භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආරම්භක ණය ගිවිසුමට අනුව, සවුදි රියාල් මිලියන 161.25 ක පිරිවැයකට පළාත් සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ක් දිවයින පුරා ස්ථාපිත කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද උපකරණ සහිත බාහිර රෝගීන් සඳහා සායන, රසායනාගාර හා පුහුණු මධ්‍යස්ථාන සහිතව සෞඛ්‍ය මධ්‍යස්ථාන 09 ක් සඳහා ගොඩනැඟිලි ඉදිකිරීමට අදාළ කාර්යයන් 2015 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

රෝහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා ලංසු කැඳවන අවස්ථාවේදී තීරණය කරන ලද රු.මිලියන 1,000 ක ඉංජිනේරු ඇස්තමේන්තුව කිසිදු විධිමත් හේතු පැහැදිලිව නොදක්වා ලංසු ඇගයීමේදී රු.මිලියන 1,800 දක්වා වැඩිකර තිබුණි. තවද ලංසු කැඳවන අවස්ථාවේදී තීරණය කරන ලද මාස 18 ක් වූ ඉදිකිරීම් නිම කිරීමේ කාල පරිච්ඡේදය පසුව මාස 12 ක් ලෙස වෙනස් කරන ලදි. කෙසේ වුවද ආරම්භක අවස්ථාවේදී ඉංජිනේරු ඇස්තමේන්තුව පදනම් කරගත් ලංසු බැඳුම්කරය කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණි.

**3.4 මූල්‍ය පාලනයට අදාළ කරුණු**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරන ලදි.

(අ) මුදල් රෙගුලාසි 133(1) හා 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ නියමය පරිදි ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 756 හි විධිවිධාන පරිදි රු.මිලියන 337.74 ක් වටිනා ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 09 සහ 12 ඡේදවලට පටහැනිව, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ මන්දගාමී කාර්ය සාධනය හා පිරිවැය වැඩිවීම ආදිය සැලකීමෙන් තොරව වැඩ බැලීමේ පදනම මත රාජකාරී ආවරණය කරන ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළත් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ සේවා කාලය අඛණ්ඩව දීර්ඝ කර තිබුණි.